# අපි සැම ථූප පූජාවට එක් වෙමු

චෛත්‍ය නම් පිදිය යුතු ස්ථානයි. මේවා වර්ග තුනක් ඇත. ශාරීරික උද්දේශික හා පාරිභෝගික වශයෙනි. ශාරීරික චෛත්‍ය නම් බුදු රජාණන් වහන්සේ ගේ ධාතූන් නිදන් කොට ඉදි වන ථූපයයි. උද්දේශික නම් උන් වහන්සේ වෙනුවෙන් නිර්මාණය කරන බුදු පිළිම වහන්සේයි. පාරිභෝගික චෛත්‍ය නම් උන් වහන්සේ බුදු වීම සඳහා පරිභෝග කළ උපකාර කර ගත් බෝධීන් වහන්සේයි . බුදුරජාණන් වහන්සේ ථූපාරහ පුද්ගලයන් පිළිබඳව පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් කොට ඇත. ඒ අනුව බුදුරජාණන් වහන්සේ , මහ රහතන් වහන්සේ, පසේ බුදුරජාණන් වහන්සේ හා සක්විති රජතුමා ථූපාරහ පුද්ගලයෝ වෙති. මෙතුමන් පිරිනිවි පසු හෝ පරලොව ගිය පසු ආදාහනය කොට ශේෂ වන ශරීර කොටස් (ධාතූන් ) නිදන් කොට චෛත්‍ය හෙවත් ථූප බඳවා වන්දනා කොට පින් රැස් කර ගත යුතු බව බුදුරජාණන් වහන්සේ බුදු මුවින් ම දේශනා කළහ.

එ හෙයිනි , බුදුරජාණන් වහන්සේ පිරිනිවි පසු උන් වහන්සේ ආදාහනය කොට ධාතූන් අට කොටසකට බෙදා රජවරු රැගෙන ගොස් තැන් පත් කොට ථූපයන් ඉදි කෙළේ. එ මෙන් ම උන් වහන්සේ පිරිනිවන් පාන්නටත් පෙර ම ය, තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයෝ බුදුරජාණන් වහන්සේගෙන් කේස ධාතූන් ලබා ගෙන ලංකාවේ තිරියායේ ගිරිහඩු සෑය ඉදි කෙළේ. බුදු රජාණන් වහන්සේ ලංකාවට පළමුවෙන් ම බින්තැන්නට වැඩි අවස්ථාවේ කළ ධර්මදේශනාවෙන් අනතුරුව සෝවාන් ව සිටි සුමන සමන් දෙව් රජුගේ ඉල්ලීම පරිදි උන් වහන්සේ ගේ කේසධාතූන් ලබා දුන් නිසා ඒවා නිදන් කොට ලංකාවේ පළමු චෛත්‍යය මහියංගන යේ ඉදි කෙරිනි. බුදු රජාණන් වහන්සේ පිරිනිවි පසු ආදාහනය කළ අවස්ථාවේ චිතකයෙන් උන් වහන්සේ ගේ අකු ධාතුව ගත් සරභූ මහ රහතන් වහන්සේ එය මහියංගන චෛත්‍යයේ නිදන් කොට එය තවත් විශාල කොට බඳවන ලදී.

මේ ආකාරයට දඹදිවත් ලංකාවේත් බුදුරජාණන් වහන්සේ ගේ ධාතූන් නිදන් කොට විවිධ චෛත්‍ය ඉදි විනි. මිහිඳු මහ රහතන් වහන්සේ වැඩි පසු ඉදි වූ ථූපාරාමය බුදු රජාණන් වහන්සේ පිරිනිවි පසු ඉදි වූ පළමු චෛත්‍යය විය. අනතුරුව ද්‍රෝණයක් පමණ වූ ධාතූන් නිදන් කොට අනුරපුරයේ ඉදි වූ මහා චෛත්‍ය රාජයා රුවන්මැලි සෑයයි. ථූපවංසය නම් පොතෙහි මේ ඉදි කිරීම පිළිබඳව මනා වර්ණනාත්මක විස්තරයක් ඇත. ලංකාවේත් බුදු දහම පැතිරී ගිය ලෝකයේ අනෙක් විවිධ රටවලත් මේ චෛත්‍යයන් ඉදි වෙයි. විහාරස්ථානයක අනිවාර්‍යයෙන් ම තිබිය යුතු අංගයකි, මේ ථූපය හෙවත් චෛත්‍යය. බෙරික් හි ශාක්‍යමු නි සම්බුද්ධ විහාරය සැදැහැති පි න්වත් ඔබ ගේ උපකාරය නිසා අපවත් වී වදාළ ගරු ගංගොඩවිල සෝම හිමියන් ගේ අනුශාසනා පරිදි ඉදි කිරීමෙන් අනුරුව මේ තරම් දුරට දියුණුවෙමින් ගෙන ආමු . එහි ඇති විහාරංගයන් අතර තිබිය යුතු චෛත්‍ය රාජයන් ඉදි කිරීම ආරම්භ කොට දැන් එහි කටයුතු නිමා වෙමින් පවතී.

ඒ අනුව එහි පින්කම් කටයුතු පිළිවෙළින් මෙසේ සිදු කරන්නට සූදානම් වෙමින් පවතී.

**අප්‍රේල් මස 20 සඳුදා දහවල් 12.58 ට පමණ කොත් වහන්සේ පැළැඳවීම.**

**මැයි මස 2 සෙනසුරාදා වෙසක් සීල සමාදානය**

**මැයි මස 3 ඉරිදා (වෙසක් පොහෝ දා) පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා නිධන්වස්තු තැන්පත් කිරීම. ( මේ සඳහා ඔබට ද විහාරස්ථානයෙන් නිධන්වස්තු ලබා ගෙන තැන්පත් කළ හැකි ය. කලින් වෙන් කරවා ගන්නට පිළිවන.)**
**මැයි මස 3 දින රාත්‍රී 8.00 සිට දින හතක් පුරාවට පැවැත්වෙන සති පිරිත් දේශනාව ආරම්භ කිරීම.**

**මැයි මස 9 සෙනසුරාදා සවස 5 ට දේවදූත පෙරහැර පවත්වා රාත්‍රී 8 .00 ට දොරකඩ අස්න දේශනාව හා මහ පිරිත ආරම්භ කිරීම.**

**මැයි 10 උදාසන මහා සංඝයා විෂයෙහි පිරිනැමෙන දානය.**
**මැයි 10 ඉරිදා සවස 2.00 ට චෛත්‍යයේ කොත නිරාවාරණය කිරීම, හා උත්සව සභාව ආරම්භ කොට පුණ්‍යානුමෝදන පින්කම පැවැත්වීම.**

ජීවිතයේ සමහර විට එක ම වරක් පමණක් ලැබෙන අවස්ථාවක් විය හැකි ය. එ මෙන් ම විශේෂයෙන් ශාක්‍යමුනි සම්බුද්ධ විහාරස්ථනයේ ඉදි කෙරෙන මේ චෛත්‍යය විශේෂිත වූ චෛත්‍යයක් බව ද දක්වනු කැමැත්තෙමු. ඒ සඳහා උපකාර කරන හැමට ම යම් දිනෙක අප කළ දේ යහපත් යැයි අපමණ නිරාමිස සතුටට හේතු වන පි න්කමක් වනු ඇත. විශේෂයෙන් ඔබේ දරුවන් මේ සඳහා සහභාගී කරවන්නට අදිටන් කර ගන්නාමෙන් ද දන්වනු කැමැත්තෙමු. යම් දිනෙක මේ සඳහා සහභාගී වූ විට ඒ මතකය ඔබටත් දරුවන්ටත් මෙලොවට පමණක් නොව පරලොවටත් අපමණ ප්‍රීතිය ගෙන දෙන පින්කමක් වනු ඇත. එ හෙයින් මේ මහා පින්කම සඳහා දරුවන් හා අනෙකුත් හිතවත් සැදැහැතියන් සමග සහභාගී වී උපකාර කොට පින් රැස් කර ගන්නා ලෙස මෙත් සිතින් දන්වා සිටිමු .



දිගාමඩුල්ලේ විමලානන්ද හිමි
බෙරික් ශාක්‍යමුනි සම්බුද්ධ විහාරය




